**www.wsws.org** ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පදිංචි ස්ථානවලින් පලවා හැරීමට එරෙහි අරගලය සඳහා ශ්‍රී ලාංකික දුගී පවුල් කමිටුවක් ගොඩනගති

## Sri Lankan shanty dwellers form committee to fight evictions

**විලානි පීරිස් විසිනි**

**2010 ඔක්තෝබර් 11**

සැප්තැම්බර් 26 දා සමාජවාදී සමානතා පක්ෂය (සසප) විසින් කැඳවන ලද රැස්වීමකට සහභාගි වූ මධ්‍යම කොලඹ පැලපත් වාසීහු අගනගරයෙන් මහජනයා පලවාහැරීම සඳහා වන ශ්‍රී ලංකා ආන්ඩුවේ සැලසුම්වලට එරෙහිව සටන් කිරීමට ක්‍රියාකාරී කමිටුවක් ගොඩනැගූහ.



*කොලඹ රැස්වීමෙන් කොටසක්*

නිවාස අයිතිය ආරක්ෂා කරගැනීමේ ක්‍රියාකාරී කමිටුව (ඒසීඩීආර්එච්) තීරන දෙකක් ගෙන ඇත. පලමුව එය අනෙකුත් පැල්පත් වාසීන්ට සහ කම්කරු පන්තියට ශිෂ්ට සම්පන්න නිවාස සඳහා වන අයිතිය ආරක්ෂා කර ගැනීමට ආයාචනයක් නිකුත් කරනු ඇත. දෙවනුව ජෙනරල් මෝටර්ස් සමාගමට සහ එක්සත් මෝටර් කම්කරු සමිතියට එරෙහිව සිය රැකියා සහ වැටුප් ආරක්ෂා කර ගැනීමට සටන් වදින ඇමරිකාවේ ඉන්දියානාපොලිස් නගරයේ ජෙනරල් මෝටර්ස් කම්කරුවන්ගේ ක්‍රියාකාරී කමිටුවට සහයෝගය පලකරන යෝජනාවක් කමිටුව සම්මත කලේ ය.

කොලඹ නගරය දකුනු ආසියාවේ වානිජ මධ්‍යස්ථානයක් බවට පත්කිරීමේ සැලසුමේ කොටසක් ලෙස දිලිඳු පවුල් 66,000ක් හෙවත් නගරයේ ජනගහනයෙන් සියයට 50කට වැඩි දෙනෙකු එහි පදිංචියෙන් ඉවත් කරන බව ආන්ඩුව මැයි මාසයේ දී නිවේදනය කලේය. පැල්පත් පෙදෙස්වලින් හෙක්ටාර 390ක් පමන මුදාගෙන දේපොල සංවර්ධනය සඳහා දේශීය සහ ජාත්‍යන්තර ආයෝජකයන්ට ලබා දීමට නියමිතය.

ලෝක සමාජවාදී වෙබ් අඩවිය (ලෝසවෙඅ) මගින් සහ ජනයා පලවා හැරීමට නියමිත ප්‍රදේශවල රැස්වීම් සංවිධානය කරමින් පැල්පත් වාසීන් සහ කම්කරු පන්තියේ අනෙකුත් කොටස් අතර මෙම යෝජනාවට එරෙහිව සසප සටන් කරනු ලබයි. පැල්පත්වාසීන් 30ක් පමන සසප රැස්වීමට සහභාගි වූ අතර ක්‍රියාකාරී කමිටුවක් සඳහා වන ඉල්ලීමට උද්‍යෝගීමත්ව ප්‍රතිචාර දැක්වූහ.

රැස්වීමේ මුලසුන දැරූ සසප දේශපාලන මන්ඩල සභික ඩබ්ලිව්. ඒ. සුනිල් සහභාගි වූ අය උනුසුම්ව පිලිගෙන සැලසුම් සහගත මහජන ඉවත් කිරීම්වල ඉතිහාසය සංක්ෂිප්තව ගෙනහැර පෑවේ ය. "කොලඹ නගර සංවර්ධන සැලැස්ම ප්‍රථම වරට 1999 දී ප්‍රසිද්ධ කල නමුත් මහජන විරුද්ධත්වය පිපිරේ යයි බිය වූ ආන්ඩුව එය පසෙකට කොට තැබී ය," යයි ඔහු කීවේ ය.

"පසුගිය අවුරුද්දේ මැයි මාසයේ දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ)ට එරෙහි යුද්ධය අවසන් වූ පසු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජාතිය ගොඩනැගීමේ නාමයෙන් 'ආර්ථික යුද්ධයක්' ප්‍රකාශයට පත් කලේ ය. මෙය දේශීය සහ ජාත්‍යන්තර මහ ව්‍යාපාරිකයන් වෙනුවෙන් කම්කරුවන් සහ අනෙකුත් පීඩිත ජනතාවන්ට එරෙහිව දියත් කල ආර්ථික පිලිවෙතකි. පැල්පත් වාසීන් ඉවත් කිරීම මෙම යුද්ධයේ කොටසකි."

සසප දේශපාලන මන්ඩල සාමාජිකා විලානි පීරිස් ප්‍රධාන වාර්තාව ඉදිරිපත් කලා ය. "ඉලක්ක කරගනු ලැබ ඇති බොහෝ පවුල් ඔවුන්ගේ නිවෙස්වල දශක ගනනාවක් ජීවත් වී තිබේ," යයි ඇය කීවා ය. "ජනයාගෙන් බහුතරය මෙම නිවාසවල වාසය කරන්නන් ලෙස මැතිවරන ලැයිස්තුවල ලියාපදිංචි වී පසුගිය මැතිවරනවල දී ඡන්දය පාවිච්චි කොට ඇත. ඔවුහු විදුලි සහ ජල බිල්පත් ගෙවමින් සිටිති. සමහරුන්ට ඉඩම්වල ඔප්පු පවා තිබේ. දැන් රාජපක්ෂ ආන්ඩුව කඩිමුඩියේ ම මෙම නිවාස 'අනවසර' යයි සොයාගෙන තිබේ."




*රැස්වීම අමතන විලානි පීරිස් සහ ඩබ්ලිව්. ඒ. සුනිල්*

ජනාධිපති රාජපක්ෂ පෙර නුවූ විරූ පියවරක් ගනිමින් සිවිල් ආයතන දෙකක් වන මාර්ග සංවර්ධන අධිකාරිය (යූඩීඒ) සහ ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව (එල්ආර්ඩීබී) සිය සහෝදර ගෝඨාභය රාජපක්ෂ විසින් පාලනය කරනු ලබන ආරක්ෂක අමාත්‍යාංශය යටතට පත්කොට ඇතැයි පීරිස් විස්තර කලා ය. ආරක්ෂක අමාත්‍යාංශය මහජනයා ඉවත් කිරීම සඳහා ඉදිරිපත් කල සැලසුමක් අගෝස්තු 12 දා ඇමති මන්ඩලය විසින් අනුමත කරනු ලැබී ය.

ආරක්ෂක අමාත්‍යාංශය සිවිල් යුද්ධයේ මිලිටරි පිලිවෙත් නගරයේ දිලින්දන්ට එරෙහිව භාවිතා කිරීම අරඹා ඇතැයි පීරිස් කීවා ය. මැයි මාසය මුල දී කොලඹ කොම්පඤ්ඤවීදියේ පවුල් 45ක නිවාස කඩාදැමීමට එරෙහිව නැගී ආ විරුද්ධත්වය මර්දනය කිරීමට ආරක්ෂක අමාත්‍යාංශය සිය ගනනක් පොලීසිය සහ හමුදාව බලමුලු ගැන්වීය. ජූලි මාසයේ ප්‍රදේශයේ තරුනයෙක් පොලීසිය මගින් අත්අඩංගුවට ගෙන පහරදීමට එරෙහිව විරෝධතාවයේ නිරත වූ මට්ටක්කුලියේ පැල්පත් වාසීන් 8,000ක් කොටුකිරීමට සිය ගනනක් වූ පොලීසිය සහ සොල්දාදුවෝ ක්‍රියා කලහ.

පලවා හරින්නන්ට නව නිවාස සම්පාදනය කරන බවට ආන්ඩුව කරන කියාපෑම් ව්‍යාජයන් බව පීරිස් අවධාරනය කලා ය. දැනටමත් ඉවත් කරනු ලැබ නිවාස සපයා නොමැති පවුල් සිටිති. ඉවත් කෙරෙන සෑම අයෙකුට ම නිවාස සම්පාදනය කිරීමට ආන්ඩුව නිවාස 66,000ක් ඉදිකල යුතු අතර එවැනි පරිමානයක කිසිවක් සැලසුම් කර පවා නැත. පවුල් දහස් ගනනකට ඉවත් කිරීමේ නිවේදන එවනු ලැබ ඇත.

නිවාස අහිමි වන්නන්ට ඇති සියලු නෛතික සහන කපාහැරීමට ආන්ඩුව නීති වෙනස් කරමින් සිටින බව ඇය පැවසුවා ය. කොලඹ මහ නගර සභාව (කොනස) අහෝසි කොට ඒ වෙනුවට ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මහජන ඡන්දයෙන් තෝරා නො ගත් අධිකාරියක් යටතට පත්කිරීම ද ආන්ඩුව නිවේදනය කොට ඇත. "ජනයා ඔවුන්ගේ නිවාසවලින් ඉවත් කිරීම නිවාස සඳහා ඔවුන්ට ඇති අහිමි කල නො හැකි අයිතිය උල්ලංඝනය කිරීමකි," ඇය කීවා ය.

කොලඹ නගරයේ ද සමස්තයක් ලෙස රටේ ද දිලිඳු ජනයාට ශිෂ්ට සම්පන්න නිවාස නොමැති වීමට සියලු ආන්ඩු ද ධනේශ්වර ක්‍රමය ද වගකිව යුතු යයි පීරිස් කීවා ය. "ආන්ඩුවේ වාර්තාවලට අනුව ශ්‍රී ලංකාවේ මිලියනයකට හිසට සෙවනක් නැත. එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) යන ප්‍රධාන විපක්ෂ දෙකට පැල්පත් වාසීන් ආරක්ෂා කිරීමට සැලැස්මක් නැත්තේ එම පක්ෂ දෙක ම රාජපක්ෂ ආන්ඩුවේ වෙලඳපොල හිතවාදී පිලිවෙත් අනුගමනය කරන නිසා ය."

ඉවත් කිරීම්වලට විරුද්ධවෙමින් හා එවැනි ක්‍රියාවකට කිසිදු ආකාරයකින් සම්බන්ධ නො වී නාගරික දිලින්දන්ට සහයෝගය දීම සඳහා පෙරට එන ලෙස සසප කම්කරු පන්තියට ආයාචනා කරන බව පීරිස් කිවා ය. සියලු ජනයාට සියලු පහසුකම් සහිත ශිෂ්ට සම්පන්න නිවාස සම්පාදනය කිරීමට බිලියන ගනනින් මුදල් යෙදවීම අවශ්‍ය ය. එහෙත් ලාභ ගරන පද්ධතිය යටතේ එය කරා ලඟා විය නො හැක. දකුනු ආසියාවේ ද ජාත්‍යන්තර පරිමානව ද සමාජවාදය සඳහා කරන පුලුල් අරගලයක කොටසක් ලෙස සමාජවාදී පිලිවෙත් හා කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් වෙනුවෙන් සසප අරගලයේ යෙදී සිටින බව ඇය විස්තර කලා ය.

පැමින සිටි බොහෝ දෙනෙකුට තමන්ගේ ම අත්දැකීම් විස්තර කිරීමේ උවමනාව සහිතව පීරිස්ගේ වාර්තාවෙන් පසු සජීවී සංවාදයක් විවෘත විය.

රාජා ලෝසවෙඅට මෙසේ කීය: "මම ඔබගේ ප්‍රතිපත්ති සමග එකඟ යි. කම්කරුවන්ට ආයාචනය නො කර ඔවුන්ගේ සහයෝගය නොමැතිව අපට අපේ නිවාස ආරක්ෂා කරගන්න බැහැ. එජාප නායක රවී කරුනානායක උසාවියේ නඩුවක් පවරන ලෙස අපට උපදෙස් දුන්නා. අපි ඒක කලා. ඒත් උසාවියට යන හැම දවසකම එක් පවුලක් වෙනුවෙන් නීතිඥයාට රුපියල් 1,500ක් (එක්සත් ජනපද ඩොලර් 14ක්) ගෙවන්න ඕන. ගොඩක් පවුල්වල මාසික ආදායම රුපියල් 3,000ට අඩුයි."

ඇඟලුම් සේවිකාවක් මෙසේ කීවා ය: "අපි දුම්රිය මාර්ගය ආසන්නයේ වාසය කරන නිසා අපිට දැනටමත් නිවස අතහැර යන ලෙස දැනුම් දී තිබෙනවා. නිලධාරීන් කියනවා අපි දුම්රියට වෙන්කල ඉඩමක ජීවත්වනවා කියලා. දුම්රිය මාර්ගය කිට්ටුව ජීවත් වීම අනතුරුදායකයි කියලා අපි දන්නවා. කිසිදු අන්තරායක් නැති පහසුකම් තියන තැනක ජීවත්වෙන්න අපිත් කැමතියි. ඒත් අපිව ඉවත් කරන්න කලින් ආන්ඩුව අපිට ගැලපෙන සුදුසු තැනක් දෙන්න ඕනි."

රැස්වීමට සහභාගි වූවෝ ශිෂ්ට සම්පන්න නිවාස සඳහා සටන් කිරීමට ක්‍රියාකාරී උද්ඝෝෂනයක යෙදීමට එකඟ වූහ. ඉක්බිතිව ඔක්තෝබර් 3දා පැවති

රැස්වීමක දී ක්‍රියාකාරී කමිටුව විධිමත් ලෙස ස්ථාපනය කරන ලදී. පුලුල් සහයෝගය දිනාගැනීම සඳහා කොලඹ පැල්පත් ප්‍රදේශවල වඩා පුලුල් උද්ඝෝෂනයක් ගෙන යාමේ අවශ්‍යතාව පිලිබඳව සාකච්ඡාව කේන්ද්‍රගත විය.

වැටුප් කප්පාදුවට සහ රැකියා විනාශ කිරීමට එරෙහිව සටන්වැදීම සඳහා ක්‍රියාකාරී කමිටුවක් ගොඩනැගීමට ඉන්දියානාපොලිස්හි ජෙනරල් මෝටර්ස් මුද්‍රා කම්හලේ කම්කරුවෝ ගත් තීරනය පිලිබඳව සසප සාමාජිකයෝ කථා කලහ. වෘත්තීය සමිතිවලින් ස්වාධීනවීමේ උද්ඝෝෂනයක අවශ්‍යතාව තේරුම්ගත් රැස්වීමට සහභාගි වූවෝ ඉන්දියානාපොලිස් කම්කරුවන්ට සහයෝගය පලකිරීමේ පහත සඳහන් යෝජනාව සම්මත කලහ.

ජෙනරල් මෝටර්ස් මුද්‍රා කම්හලේ ක්‍රියාකාරී කමිටුවේ සහෝදරවරු වෙත,

ශ්‍රී ලංකාවේ අගනුවර වන කොලඹ අපගේ නිවාසවලින් පලවා හරිනු ලැබීමේ අනතුරට මුහුන පා සිටින පැල්පත් වැසියන් වන අපි ජෙනරල් මෝටර්ස් සමාගම, එක්සත් මෝටර් කම්කරු සමිති සහ කම්හල මිල දී ගැනීමට අපේක්ෂා කරන ජේ.ඩී. නෝර්මන්ට එරෙහිව, වැටුප් සහ රැකියා ආරක්ෂා කරගැනීමේ අරගලයක නිරත ඔබට අපගේ හෘදයාංගම සුභපැතුම් සහ උනුසුම් සහයෝගය පිරිනැමීමට කැමැත්තෙමු.

එක්සත් ජනපදයේ ඔබ ජීවන කොන්දේසි බිඳදැමීමට හා වැටුප් අඩකින් කප්පාදු කිරීමට එරෙහිව සටන් කරද්දී ශ්‍රී ලංකාවේ අපි අපගේ නිවාස අයිතිය රැකගැනීමේ අරගලයක නිරතව සිටිමු.

ජනාධිපති මහින්ද රාජපක්ෂගේ තන්ත්‍රය විසින් ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ අවශ්‍යතා වෙනුවෙන් දියත් කරනු ලැබ තිබෙන "ආර්ථික යුද්ධය" යටතේ කොලඹ නගරය දකුනු ආසියාවේ වානිජ කේන්ද්‍රයක් බවට පත් කරනු ලැබෙමින් තිබේ. එහි කොටසක් ලෙස දිලිඳු කම්කරුවන් සහ පීඩිතයින් වන අපගේ පවුල් 66,000ක් බලහත්කාරයෙන් ඉවත් කොට එම ඉඩම් ජාත්‍යන්තර සහ දේශීය ආයෝජකයන්ට ලබාදීමේ සැලසුම් දැනට ම සකස් කර තිබේ.

එක්සත් ජනපදය තුල ඔබගේ අධිෂ්ඨානවත් අරගලය අපට වඩ වඩා දිරිගන්වන අතර එය අප සඳහා මගපෙන්වන වැදගත් ආලෝකයක් ලෙස ක්‍රියා කරයි.

ඔබගේ කමිටුව සහ එහි ක්‍රියාමාර්ගය කම්කරු පන්තිය විසින් ගනු ලබන ස්වාධීන ක්‍රියාකාරීත්වයක් දෙසට වූ ශක්තිමත් ඉදිරි පියවරක් ලෙස  අප දකින අතර ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ අවශ්‍යතා සඳහා ඔබගේ වැටුප් කප්පාදු කිරීමට සම්මාදම් වී ඇති යූඒඩබ්ලිව් සමිතියට එරෙහිව ඔබගේ විමුක්තිය ඔබ විසින් ම සාක්ෂාත් කරගැනීමේ මාවත ඔබ ම තීරනය කිරීමේ පියවරක් ලෙස දකිමු.

ප්‍රධාන විපක්ෂ වන එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා විවිධ වාමාංශික පක්ෂ විසින් ඉදිරියට දමනු ලබන ඊනියා නෛතික පියවර සහ ආන්ඩුවට පීඩනය යෙදීමේ උපාය ප්‍රතික්ෂේප කරමින් අපි ද නිවාස සඳහා වන අපගේ අයිතිය ආරක්ෂා කරගැනීමේ අරගලයේ දී අපගේ ම නායකත්වය සහ අපගේ ම ක්‍රියාමාර්ගයක් සහිත ක්‍රියාකාරී කමිටුවක් යටතේ අරගලයේ නිරතව සිටින්නෙමු.

අපට ඔබගේ සහයෝගය සහ ඔබට අපගේ සහයෝගය වසයෙන් ප්‍රාග්ධනයට එරෙහි අරගලයේ දී ජාත්‍යන්තර සහයෝගයේ සහ කම්කරුවන් සහ පීඩිත ජනතාවන්ගේ එක්සත් කමේ සාරභූත ස්වාභවය අපි තේරුම් ගනිමු. ඔබට අප දෙන සහයෝගය එවැනි ජාත්‍යන්තර සහයෝගයක් දෙසට ගැනෙන නව පියවරක් ලෙස අපි දැකගනිමු.

සහෝදරත්වයෙන්,

නිවාස අයිතිය සඳහා වන ක්‍රියාකාරී කමිටුව (ඒසීඩීආර්එච්)

කොලඹ, ශ්‍රී ලංකාව.

© www.wsws.org